# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**11 ශ්‍රේණිය**

## කෘෂි හා ආහාර තාක්ෂණය - II

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 3 යි

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

01) පසුගිය දිනවල රටේ පැවති අධික වැසි තත්ත්වය හේතුවෙන් වෙළඳ පොලේ එළවළු ඇතුළු කෘෂි නිෂ්පාදනවල මිළ ඉහළ යාමක් දැකිය හැක. මේ නිසා ග්‍රාමීය හා නාගරිකව ජීවත් වන ජනතාව ගෙවතු ආශ්‍රිතව එළවළු ඇතුළු අනෙකුත් බෝග වගා කිරීමට යොමු වී ඇත.

i.
a) ශ්‍රී ලංකාවට මෝසම් සුළං පදනම් කර ගනිමින් වැසි ඇති වන ආකාර දෙකක් නම් කරන්න.
b) එම වැසි පදනම් කර ගනිමින් ක්‍රියාත්මක ප්‍රධාන වගා කන්න දෙක නම් කරන්න.

ii.
a) අධික වර්ෂාවත් සමඟ පාංශු ඛාදනය වීම ප්‍රබල ගැටළුවක් පාංශු ඛාදනය නිසා සිදුවන අහිතකර බලපෑම් දෙකක් ලියන්න.
b) ගෙවත්තේ පාංශු ඛාදනය වළක්වා ගැනීමට යෙදිය හැකි යාන්ත්‍රික ක්‍රම දෙකක් සඳහන් කරන්න.

iii.
a) ගෙවත්තේ වගා කිරීම සඳහා බීජ තවාන් දමා පැළ ක්ෂේත්‍රයේ සිටුවන බෝග වර්ග දෙකක් නම් කරන්න.
b) බීජ තවාන් නොදමා ක්ෂේත්‍රයේ බීජ සිටුවන බෝග වර්ග දෙකක් සඳහන් කරන්න.

iv.
a) තවාන් පැළවලට බහුලව වැළඳෙන දිලීර රෝගයක් නම් කරන්න.
b) තවානේ රෝග හා පලිබෝධ පාලනයට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

v.
a) බෝග වගාවේ දී යොදා ගනු ලබන භූගත ජල සම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.
b) පසේ රැඳී ඇති අතිරික්ත ජලය පසෙන් ඉවත් කිරීමට යොදා ගත හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

vi.
a) ගෙවතු වගාවේ දී කාබනික පොහොර භාවිතයේ ඇති වාසි දෙකක් ලියන්න.
b) බහුලව භාවිතා වන කාබනික පොහොර වර්ග දෙකක් නම් කරන්න.

vii.
a) ගෙවතු ආශ්‍රිතව වැවෙන භූගත කඳක් සහිත වල් පැළෑටි දෙකක් නම් කරන්න.
b) වල් පැළ පාලනය සඳහා යොදා ගනු ලබන යාන්ත්‍රික ක්‍රම දෙකක් සඳහන් කරන්න.

viii.
a) ශ්‍රී ලංකාවේ දැනට වගා කරන දේශීය පාරම්පරික වී ප්‍රභේද දෙකක් නම් කරන්න.
b) වැඩි දියුණු කළ වී ප්‍රභේදවල ලක්ෂණ දෙකක් ලියන්න.

ix. බීජ සිටුවීමට පෙර බීජ ප්‍රතිකාර කරනු ලබයි. බීජ ප්‍රතිකාර කිරීමේ අරමුණු හතරක් සඳහන් කරන්න.

x. පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ වාසි හා අවාසි දෙක බැගින් දක්වන්න.

02)බෝග වගාව කෙරෙහි බලපාන ප්‍රධානම සාධක වන්නේ පස හා දේශගුණයයි.

i.


a) පස නිර්මාණය වීමට මූලික වන පාෂාණ වර්ග තුනක් නම් කරන්න.

b) ඔබ සඳහන් කළ එක් පාෂාණ වර්ගයකට නිදසුන් දෙකක් සඳහන් කරන්න.

ii.

a) පාංශු වයනය යන්න කෙටියෙන් හඳුන්වන්න.

b) පාංශු වයනයේ කෘෂිකාර්මික වැදගත්කම් තුනක් සඳහන් කරන්න.




iii.

a) මෙම උපකරණ භාවිතා කරනු ලබන්නේ කුමන කාලගුණික පරාමිතිය මැන ගැනීම සඳහා ද?

b) මෙහි A, B, C හා D යන කොටස් නම් කරන්න.

c) මෙම උපකරණ අදාළ මිනුම් ලබා ගැනීම සඳහා ස්ථානගත කිරීමේ කලකා බැලිය යුතු කරුණු දෙකක් ලියන්න.

03)බෝග වගාවෙන් සාර්ථක අස්වනු ලැබීමට උසස් තත්ත්වයේ නිරෝගී පැළ සිටුවීම හා ක්‍රමාණුකූලව බිම් සකස් කිරීම හේතු වේ.

i. බිම් සකස් කිරීමේ අරමුණු හතරක් සඳහන් කරන්න.

ii.

a) අතුරුයත් ගෑම යන්න කෙටියෙන් හඳුන්වන්න.

b) අතුරුයත් ගෑමට අයත් කාර්යයන් දෙකක් ලියන්න.

c) බෝග සංස්ථාපනය සඳහා සකසනු ලබන පාත්ති වර්ග තුනක් සඳහන් කරන්න.

iii.

a) තවාන් පාත්ති ජීවාණුහරණය කරන ක්‍රම තුනක් ලියන්න.

b) තවාන් පැළ දෘඪි කිරීම යනු කුමක්ද?

c) පැළ දෘඪි කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

04)කෘෂිකර්මාන්තයේ දී බෝග නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට ප්‍රධාන හේතුවක් වන්නේ පලිබෝධ පාලනයට අධික වියදම් දැරීමට සිදුවීමයි.

i.

a) වගා භූමිය තුළ තිබෙන වල් පැළෑටි බෝගයට හානිදයක මට්ටමට අඩුවෙන් පවත්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න.

b) වල් පැළෑටි හා පලිබෝධ පාලනයට යොදා ගන්නා ප්‍රධාන පලිබෝධ පාලන ක්‍රම හතරක් නම් කරන්න.

ii.

a) පූර්ණ රූපාන්තරණයක් සහිත කෘමියෙකුගේ ජීවන චක්‍රයේ දැකිය හැකි අවස්ථා නම් කරන්න.

b) පූර්ණ රූපාන්තරණයක් පෙන්නුම් කරන කෘමි පලිබෝධකයන් දෙදෙනෙකු නම් කරන්න.

iii.

a) රසායනික පලිබෝධනාශක භාවිතයේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් තුනක් සඳහන් කරන්න.

b) රසායනික පලිබෝධනාශක භාවිතයේ අහිතකර බලපෑම් තුනක් ඉදිරිපත් කරන්න.

05)බෝග වගාවේ දී නව පරම්පරාවක් බිහිකර ගැනීම සඳහා ලිංගික ප්‍රචාරණ ක්‍රම මෙන්ම අලිංගික ප්‍රචාරණ ක්‍රම ද භාවිතා වේ.

i.

a) බීජ ප්‍රරෝහණය සඳහා අවශ්‍ය සාධක තුනක් ලියන්න.

b) බීජ අක්‍රියතාවය යනු කුමක්ද?

c) බීජ අක්‍රියාතාවය ඇතිවීමට බලපාන හේතු තුනක් ලියන්න.

ii.

a) බද්ධ කිරීම සඳහා ග්‍රාහකයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

b) අංකුර බද්ධ ක්‍රම දෙකක් නම් කරන්න.

c) අඹ පැළයකට කුඤ්ඤ බද්ධයක් සිදුකරන ආකාරය නම් කරන ලද රූප සටහනකින් දක්වන්න.

iii. පටක රෝපණයේ වාසි තුනක් සඳහන් කරන්න.

06)කෘෂිකර්මාන්තයේ දී පවතින සීමිත සම්පත් හා යෙදවුම් වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා විවිධ ගොවිතැන් ක්‍රම භාවිතා වේ.

i.

a) හේන් ගොවිතැනේ ලක්ෂණ හතරක් ලියන්න.

b) හේන් ගොවිතැනේ දී අනුගමනය කරන ප්‍රධාන අංග තුනක් නම් කරන්න.

ii.

a) සමෝධානිත ගොවිතැන් පද්ධතියක ඇතුළත් ප්‍රධාන අංග තුනක් නම් කරන්න.

b) සමෝධානික ගොවිතැන් ක්‍රමයේ වාසි හතරක් ලියන්න.

iii.

a) සංරක්ෂිත ගොවිතැන් ක්‍රමය හඳුන්වන්න.

b) සංරක්ෂිත ගොවිතැන් ක්‍රමයේ වාසි හතරක් සඳහන් කරන්න.

07)එළවළු හා පලතුරු වැනි කෘෂි නිෂ්පාදන වලින් විශාල ප්‍රමාණයක් පසු අස්වනු හානි නිසා අපතේ යාම සිදුවේ. මෙම තත්ත්වය මිළ ඉහළ යාමට ද හේතුවක් වී ඇත.

i.

a) පසු අස්වනු හානි සිදුවීමට බලපාන පෙර අස්වනු සාධක හතරක් ලියන්න.

b) අස්වනු හානි වීමට බලපාන පසු අස්වනු අවස්ථා තුනක් සඳහන් කරන්න.

ii.

a) අස්වනු නෙලීමේ දී සිදුවන අස්වනු හානි පාලනයට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න.

b) අස්වනු හානි වීම පාලනය කිරීමට අස්වනු ප්‍රවාහනයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

iii. කෘෂි බෝගවල පස් අස්වනු හානි අවම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් ලියන්න.